# සිංහල භාෂාවේ පද බෙදීම පිළිබඳ නව සම්මතයක අවශ්‍යතාව පිළිබඳ විමසුමක්

තිඹිරිවැව සිරිසුමන හිමි
නාලක ජයසේන

**Abstract**

This paper examines the necessity of a new convention on word division in Sinhala. When considering the diglossia in Sinhala language, it can be identified that many schools of language have different guidelines and recommendations to divide words. In this investigation, the focus is on the written form. The research hypotheses of the research are there should be multiple rules in the usage of language. A pilot case study was done to prove or disprove the hypotheses. The main observation of this paper is the ambiguity of the word division in Sinhala writing. A library survey has been done as the method of the research and primary sources being the books written by experts in Sinhala language on the topic and secondary sources were Sinhala fictions.

**Keywords:** *word division, Sinhalese grammer, schools of language*

**යතුරු පද :** පද බෙදීම, සිංහල ව්‍යාකරණය, භාෂා ගුරුකුල

## 01. හැඳින්වීම

භාෂාවක් යනු සම්මත, නීති, රීති සහ මතවාද සහිත පද්ධතියකි. නීතිය හා රීතිය ක්‍රියාත්මක වීමේ ක්‍රමවේද කිහිපයක් ඇති බව භාෂාවේදීහු පෙන්වා දෙති. (දිසානායක 2018,). කථනයට සාපේක්ෂව ලේඛනයෙහිලා එය වඩාත් සංකීර්ණ වෙයි. බොහෝ භාෂාවේදීන්ගේ අවධානයට ලක් නොවුණද ලේඛනයේදී මෙන්ම භාෂණයේදී පද බෙදීමක් සිදු කැරේ. පද බෙදීමක් සිදු කරන්නේ නම් කිසිසේත්ම ශ්‍රවණය කරන්නාට පයීතය ග්‍රහණය කරගත නොහැකි බව උපකල්පනය කළ හැකිය. කෙසේ වෙතත් ලේඛනයේ මෙන්ම භාෂණයේදී පද බෙදීම පවතින බව තහවුරු කළ හැකිය. ලේඛනයේදී පද බෙදීම පැහැදිලිව දැකගත හැකි අතර භාෂණයේදී පද බෙදීම සිදු කරන්නේ යතිය තැබීමෙනි. යතිය තැබීම යනුවෙන් මෙහිදී අදහස් කරන්නේ තමන් ප්‍රකාශ කරන්නාවූ වචන අතර හිස්තැනක් හෙවත් අතර/ඉඩක් තබමින් එය ප්‍රකාශ කිරීමයි. භාෂණයේදී පොදුජන භාෂක සමාජයේ ඇති කරගත් සම්මුතියක් ද පවතී. එහිලා පද බෙදීම ප්‍රාදේශීය ව්‍යවහාර වශයෙන් වෙනස්ව රූප නියෝජනය කරනු ලබන අතර උගත් බව හා නූගත් බව අනුවද ඇතැම් විට පද බෙදීමේ වෙනස්කම් දක්නට ලැබේ. ලේඛනය සම්බන්ධ පද බෙදීම් සම්මුතිය හා ඒකඟතා කොතෙකුත් දක්නට ලැබුණද භාෂණය සම්බන්ධ පද බෙදීම හෝ එකගතා සම්මුති පිළිබඳව නිගමනවලට එළඹී ඇති ආකාරයක් දක්නට නොලැබේ. ලේඛනය සම්බන්ධ පුද්ගල ප්‍රයත්න පද බෙදීම විෂයෙහි විද්‍යමාන වුවත් භාෂණය විෂයෙහි එවැන්නක් දක්නට නොලැබේ. කෙසේ වෙතත් සිංහල භාෂා විෂයෙහි භාෂණයේද පද බෙදීමක් ඇති බව තහවුරු කළ හැකිය. එහෙත් මෙහිලා අප අවධානය යොමු කරන්නේ ලේඛනය කෙරෙහි පමණි.

## 02. අධ්‍යයනයේ වැදගත්කම

සිංහල භාෂා විෂයකද ගුරුකුලවල පටන් විවිධ ඇගයුම් ආකල්ප හා නිර්දේශ ආදි භේද රාශියක් පවතියි. යම්කිසි විෂයක් පිළිබඳව ඒකමතික තීරණයක් තිබේ නම් හෝ එකම නීතියක් තිබේ නම් ඒ පිළිබඳව වෙනස් ආකාරයේ මතභේද පැන නොනගින්නේ නම් ඒ පිළිබඳ රීති රාශියක් බිහි නොවේ. ඒ අරබයා ප්‍රාමාණික එක කෘතියක් ප්‍රමාණ වේ. එහෙත් පද බෙදීම පිළිබඳ උගතුන් අතර මෙන්ම දුහුනන් අතරද

ඒකමිතියක් නොමැති නිසා විවිධ ගුරුකුලවලින් විවිධ සම්ප්‍රදායවලින් ඒක පුද්ගල ප්‍රයත්න හා බහු පුද්ගල ප්‍රයත්න ලෙසින් යන මේ ආකාර දෙකෙන්ම පද බෙදීම පිළිබඳව විවිධ කෘති හා අදහස් පළ වී තිබේ. හුදෙක්ම ඒවා කොටස් දෙකකට වර්ගීකරණය කළ හැකිය.

1. පද බෙදීම පිළිබඳව රචනා වූ පොත්
2. ව්‍යාකරණය සඳහා උපදෙස් දෙන හෝ වැරදි ව්‍යවහාරය සම්බන්ධයෙන් සකස් කරන ලද පොත් යනුවෙනි

සිංහල භාෂාවේ පද බෙදීම පිළිබඳව කෘති දීර්ඝ කාලයක් පුරාවට ප්‍රකාශයට පත්වී ඇතත් වර්තමානය වන විට පවා එහි ඒකමිතියක් දක්නට නො නොලැබේ. උදාහරණයක් ලෙස ව්‍යාකරණය භාෂාව සාහිත්‍ය උගන්වන ආචාර්යවරුන් මෙන්ම ස්වාධීන ලේඛකයන් පර්යේෂකයන් තමන්ට අනන්‍ය වූ පද බෙදීමක් හෝ සිය ගුරු කුලයේ අනන්‍යතාව ආරක්ෂා කිරීමට ප්‍රයත්න දැරීම නිසා පද බෙදීම් පිළිබඳව ඒක මිතියක් නොමැති බව දක්නට ලැබේ. ඒ අතර සිංහල ලේඛනයෙහිලා පද බෙදීම නම් වූ ව්‍යාකරණාංගය විශේෂ වෙයි. මක්නිසාදයත් පද බෙදීම සම්බන්ධ විවිධ සම්මත රාශියක් සිංහලයෙහි තිබීමයි. නිදසුන් කිහිපයක් මෙසේ දැකිය හැකිය. පර්යේෂණයෙහිලා සාහිත්‍ය සමීක්ෂාවටද යොදා ගනු ලබනුයේ එකී නිර්දේශය.

## කමිටු වශයෙන් ඇති කළ සම්මත

**පද බෙදීම් කාරක සභාවේ වාර්තාව** 1957

**සිංහලයේ පද බෙදීම** සාහිත්‍ය උපදේශ සභා වාර්තාව 1959

**සම්මත සිංහලය** - සම්මත සිංහල කමිටු වාර්තාව 1968 හා එහි සංශෝධිත වාර්තාව 1969

**සිංහල ලේඛන රීතිය** - ජාතික අධ්‍යාපන ආයතනය 1989 හා 2001/ 2015 සංශෝධන

**සිංහලයේ වචන වෙන් කිරීම** - සිංහල භාෂාභිවර්ධන සංගමය 1991

**ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමය** 1991

**සිංහල ලේඛන ව්‍යවහාරය උපදේශ සංග්‍රහය** 2014

**පුද්ගලයන් වශයෙන් ඇති කළ සම්මත**

**සිංහලයෙහි පද බෙදුම** - අරිසෙන් අහුබුදු හා ලියනගේ ජිනදස් 1959

**සිංහලයේ පද බෙදීම** - ලයනල් ලොකුලියන 1972

**නිවැරදි වහර-පද බෙදීම** - ගුණපාල සේනාධීර 1984

**නිවැරදි සිංහල මග** - දෝ දේ මොහොට්ටි සහ සමන් තිලකසිරි 1989

**නිවැරදි වහරට අත්වැල** - පද බෙදීම මුනිදාස සෙනරත් යාපා 1989

**පහදුව** - රැයිපියෙල් තෙන්නකෝන් 1993

**වියරණ හුරුව** - විල්ෆ්‍රඩ් පී බී පෙරේරා 1997

**පද බෙදීම** - බන්දුසේන ගුණසේන 2004

**සිංහල භාෂාවේ පද බෙදීම සහ විරාම ලක්ෂණ භාවිතය** - ධර්මා රාජපක්ෂ 2008

**සුබැසිවහර** - වෝල්ටර් මාරසිංහ 2011

**පද බෙදීම** - ජේ බී දිසානායක 2016

**නිවැරදි සිංහලය** - ජේ බී දිසානායක 2018

මේ අනුව පැහැදිලි වන්නේ සිංහල භාෂාව විෂයෙහිලා පද බෙදීම වචන වෙන් කිරීම හෝ වචන එකතු කිරීම යනාදී ලෙස හැඳින්වෙන ලේඛන ප්‍රයෝගයට නිසි එකඟතාවක් ඇති කර ගැනීමට තවමත් නොහැකි වී ඇති බවයි. එමතු නොව එය දුහුනන්ට පමණක් නොව වියතුන්ටද ගැටලු ඇති කරන වාද විෂයක් බවට පත්ව ඇත.

## 03. පර්යේෂණ අරමුණු හා ක්‍රමවේදය

මෙම පර්යේෂණයෙහිලා අරමුණ වී ඇත්තේ පද බෙදීම පිළිබඳ නව සම්මතයක අවශ්‍යතාව පිළිබඳ විමසීමයි. එහිලා මෙම පර්යේෂණ ආකෘති දෙකකින් සිදු කෙරේ.

1. පද බෙදීම පිළිබඳ නියමු අධ්‍යයනයක් ලෙස ප්‍රත්‍යෙක අධ්‍යයනයක් සිදු කිරීම.

2. පද බෙදීම පිළිබඳ සාහිත්‍යයික මතවාද පිළිබඳ විමර්ශනයක් සිදු කිරීම.


එහිලා පර්යේෂණ ගැටලුව වූයේ පද බෙදීමෙහිලා නව සම්මතයක අවශ්‍යතාවක් තිබේද යන්නයි. මෙම පර්යේෂණය පිණිස අප ගොඩනගනු ලබන උපන්‍යාසය වන්නේ භාෂා භාවිතයේදී බහුවිධ නීති ඇත යන්නයි. පර්යේෂණ විධික්‍රමය වශයෙන් පුස්තකාලය අධ්‍යයන ක්‍රමය යොදා ගනු ලබන අතර එහිලා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ඉහත දැක්වූ පද බෙදීම පිළිබඳ ගුරුකුල හා පුද්ගල සම්මුතිද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් සිංහල සාහිත්‍යයේ නිර්මාණාත්මක ප්‍රබන්ධද යොදා ගැනේ. පර්යේෂණයේ ක්ෂේත්‍රය වන්නේ සිංහල ව්‍යාකරණයයි.

**04 සාකච්ඡාව**

පද බෙදීම යන වියරණාංගය අවශ්‍ය හා වැදගත් වූයේ මුද්‍රණ යන්ත්‍රයේ ආගමනයත් සමගිනි. අතීතයේ මෙරට තිබූ පුස්කොළ පොත්වල එවැනි පද බෙදීමක් නොතිබිණ. එහෙත් එය පරිශීලනය කරන්නන් එම කාර්ය මැනැවින් සිදු කරගත් බව තීරණය කරන්නට පර්යේෂණ අවශ්‍ය නොවන්නේ, භාෂාව යනු සජීව සංසිද්ධියක් වීමත් භාෂාත්මක සංජානනය යන්න මොළය/මනස ඔස්සේ ක්‍රියාත්මක වීමත් හේතුවෙනි. පුස්කොළ පොත්වල වර්තමානයේ මෙන් පද බෙදීම් සම්මතයක අවශ්‍යතාව පැන නැගීම සඳහා බලපෑ කාරණා කීපයක් ඇත. එයින් එක කාරණයක් නම් පුස්කොළ පොත්වල පද බෙදීම සිදු කරන්නේ නම් ලැබෙන අඩු ඉඩ ඒ සඳහා අවාසි සහගත තත්ත්වයක් වීම සහ පුස්කොළ පොතක පද බෙදීම් සිදුකරමින් රචනා කරන්නේ නම් එය ඉතාමත් අපහසු තත්ත්වයක් වීමයි. එය ලේඛකයාට ඉතා අපහසු කාර්යක් වීම හා පන්හිදෙන් ලිවීමේදී එක දිගට ලියාගෙන යෑමේ පහසුව නිසාත් මුලින් ආරම්භ කරන ලේඛන කාර්ය එක දිගටම නොනවත්වා සිදුකරගෙන ගොස් පත්ඉරුව අවසානයේ එම රචනය නැවැත්වීම එවක සම්මත වී තිබූ ක්‍රමවේදය නිසා පුස්කොළ පොත් රචනා කරන ලේඛකයන් පද බෙදීමට උනන්දු නොවූ බව පෙන්වා දිය හැකිය. එහෙත් දිනපතා පුවත්පත් සඟරා වැනි මාධ්‍ය හා ජනමාධ්‍ය ක්‍රමයෙන් දියුණු වීමත් සමග කියවීම පුද්ගල ජීවිතයට ඒකාබද්ධ වූ

අංගයක් බවට පත් විය. මේ කාරණය පදනම් කොටගෙන පද බෙදීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු විය.

උදාහරණයක් ලෙස පිරුවාණා පොත් වහන්සේගේ කුමන ස්ථානවලදී යතිය තැබිය යුතුද හඬ නැවැත්විය යුතුද යන්න පිළිබඳව ඔවුන්ගේ මතකයේ හොඳින් රැඳී තිබිණ. එහෙත් එදිනෙදා පළවන පුවත්පතක එලෙස මතකයේ තබාගත නොහැකිය. ඒ සඳහා යම්කිසි රාමුගත කළ පද බෙදීම් ක්‍රමවේදයක් භාවිතයට ගත යුතු වීම නිසා මේ සම්මතයක් ඇති කර ගැනීම සඳහා සමාජයේ විද්වත්හු උත්සුක වූහ. මේ කාරණා මූලික කරගෙන පද බෙදීම පිළිබඳව පිළිගත් සම්ප්‍රදායක් ඇති කර ගැනීම සඳහා මංපෙත් විවර වූ බව පෙන්වා දිය හැකිය.





පද බෙදීම රහිත පුස්කොළ පොතකින් කොටසක්

කෙසේ වෙතත් මේ වන විට මුද්‍රණ ශිල්පය ඉතා දියුණුව ඇති අතර තාක්ෂණයේ සීඝ්‍ර වෙනස්කම් හමුවේ එය නව්‍යකරණයට නතුව ඇත. ඒ කවර නව තත්ත්ව හමුවේ වුවද පද බෙදීම පිළිබඳ සිංහල භාෂාවේ ඒකමිතියක් නිර්මාණය වී නැති අතර එසේ ඒකමිතියක් නොමැති ඇතැම් අක්ෂර වින්‍යාසාත්මක සිද්ධිද සිංහල භාෂාවේ ඇත.

## 05. පද බෙදීම

පදයක් යනු කුමක්ද යන්නට ව්‍යාකරණාත්මක හා වාග්විද්‍යාත්මක නිර්වචන කිහිපයකි. ශේෂව ඇති පැරණිම වියරණ ග්‍රන්ථය සේ සැලකෙන (කාව්‍ය නිර්දේශ ග්‍රන්ථයකි) සිදත් සඟරාවෙහි පදයට උප්පත්ති ස්ථාන ගැන කියැවෙයි.

පියවි දෙවැදෑරුම්

දා පියවි සද පියවි

පදයොන් දා පියවි නම්

විබතැනට ඇසිරු සද පියවි නම් යනුවෙනි **(සිදත් සගරා විස්තර සන්නය,1934: 15).**

පදයට උප්පත්ති ස්ථාන වන්නේ ධාතු ප්‍රකෘති හා ශබ්ද ප්‍රකෘතිය. දඹදෙණිය යුගයේදී රචනා කරන ලද සිදත් සඟරාවේ පද පිළිබඳව විවරණය කොට තිබේ. සිදත් සඟරා කතුවරයා පද ප්‍රකෘති යනුවෙන් හඳුන්වා තිබේ. පද මූලිකව ශබ්ද ප්‍රකෘති හා ධාතු ප්‍රකෘති යනුවෙන් කොටස් දෙකකට වර්ගීකරණය කර ඇත. සිදත් සඟරා කතුවරයා ප්‍රකෘති කොටස් දෙකකට වර්ගීකරණය කොට දක්වන අතර ධාතු ප්‍රකෘතිය ප්‍රධාන බවත් පදවල ප්‍රභවය සඳහා මූලිකව හේතු වන්නේ ධාතු ප්‍රකෘතිය බවත් විභක්ති ආදියට ශබ්ද ප්‍රකෘතිය මූලික වන බවත් දක්වා ඇත. එහි ධාතු ප්‍රකෘති හා ශබ්ද ප්‍රකෘතිය දක්වා ඇති ආකාරය ව්‍යාකූල බවක් පෙනේ. රත්මලාන ධර්මාරාම හිමියෝ ප්‍රකෘති හතර වැදෑරුම් බව අවධාරණය කරති **(ධර්මාරාම 15).** පද සම්බන්ධව වාග්විද්‍යාත්මකව සලකන විට පදාණු, පදිම හා පදක පිළිබඳ විග්‍රහය වැදගත් වෙයි. එසේම වාග්විද්‍යාත්මකව නාම පද යන්න නාම වචන ලෙස හැඳින්වෙයි. එසේම පදවලටම සමානව භාෂණයේදී එය වචන යනුවෙන් යෙදීමද දැකිය හැකිය.

සිංහල වියරණය අනුව පද වර්ග හතරකි

1. නාම පද

2. ක්‍රියා පද

3. නිපාත පද

4. උපසර්ග පද

වාග්විද්‍යාවේදී උපසර්ග පද වර්ගයක් ලෙස නොසැලකෙන අතර නිපාත හා උපසර්ග පද පොදුවේ අව්‍ය පද ලෙසද හැඳින්වෙයි.

සිංහල භාෂාවෙහිලා පද බෙදීම සම්බන්ධව වර්ගීකරණයක් ඉදිරිපත් කරන ජේ බී දිසානායක ඒවා පස් වැදෑරුම් කොට දක්වයි **(දිසානායක,2014).**

එනම්

1. වෙන් කොට ලිවිය යුතු පද

2. එක් කොට ලිවිය යුතු පදාණු

3. එක් කොට ලිවිය යුතු පද

4. එක් කොට හෝ වෙන් කොට ලිවිය හැකි පද

5. වරදවා වෙන් කොට ලියන පද වශයෙනි

කෙසේ වෙතත් පොදුවේ පද බෙදීම සම්බන්ධ සාම්ප්‍රදායික නිර්දේශවල ඒවා ත්‍රිවිධ වේ.

1. එක්ව ලියන පද

2. වෙන්ව ලියන පද

3. එක්ව හෝ වෙන්ව ලිවිය හැකි පද

එහෙත් පද බෙදීමේ සාම්ප්‍රදායික මත අබිබවා සාම්ප්‍රදායිකව වෙන්ව ලියන පද එක්කර තැබීමෙන් වචන වෙන් කිරීමේ රීතිය බිහි


විය. භාෂාවේ ලිහිල් බව සහ වෙනස් වීම පිළිගැනීම සේම ඇතැම් විට මුද්‍රණ හෝ ප්‍රකාශනවල ඉඩකඩ අවම වීම නිසා එවන් රීතියක් නිර්මාණය වීම දැකිය හැකිය.


සාමාන්‍යයෙන් පද බෙදීමේදී ප්‍රධාන වශයෙන් වියරණයේ සිදු කෙරෙනුයේ ඒ ඒ වර්ගවල පද වෙන් වෙන්ව ලිවීමයි. එහෙත් නාම ක්‍රියා නිපාත යනුවෙන් පද තුන් වර්ගයක් සිංහලයේ ඇති බව සැලකෙන නිසා ඒ එක් එක් පදය වෙන් කර ලිවීමට ඇතැමෙකු පෙලඹෙතත් ඒ මගින් ගැටලු මතු වන අවස්ථාද ඇත. එසේම කොළඹ විශ්වවිද්‍යාලයේ සැසියකදී පුෂ්පානන්ද ඒකනායක යෝජනා කළේ මෙය වචන එක් කර ලිවීම ලෙස හැඳින්වීම වඩා ඖචිත්‍ය බවයි. (සහභාගිත්ව නිරීක්ෂණය) ඒ මගින්ද පැහැදිලි වන්නේ පද බෙදීම විෂයයක ඇති නව මතවාදයි.


## 06 නියමු අධ්‍යයනය


මෙම පත්‍රිකාවට ප්‍රවේශයක් වශයෙන් දැනට භාෂාව හා සාහිත්‍ය පිළිබඳ අභ්‍යන්තර උපාධියක් හදාරනු ලබන විශ්වවිද්‍යාලයීය සිසුන් 50 දෙනෙකු යොදා ගෙන අපි නියමු අධ්‍යයනයක් සිදු කෙළෙමු. ඔවුන්ගේ අනන්‍යතාව පර්යේෂණ මූලධර්ම ප්‍රකාරව මෙහි සඳහන් නොකරමු.

එම පර්යේෂණයේදී පද බෙදීම පිළිබඳ ඔවුන්ව පර්යේෂණයකට නතු වන බව නොදත්හ. එය සිදු කළේ තෝරාගත් වැකි දෙකක් ශබ්ද කොට පටිගත කොට එය අසා ලිවීමට සැලසීමෙනි. එම නියැදියෙන් තෝරාගත් සටහන් කිහිපයක් මෙසේ දක්වමු.









නියමු අධ්‍යයනයෙන් ලබාගත් නියැදි කිහිපයක්

ඉහත පර්යේෂණයට උපුටා ගත්තේ නලින් ද සිල්වා 2008 මැයි 07 වනදා විදුසර පුවත්පතට ලියන ලද මහාවංශයෙහි පසුබිම නමැති ලිපියෙහි එන පහත ඡේද ද්වයයි.

'කාල් මාක්ස් පඬිවරයා සමාජයීය නිෂ්පාදනය මත පදනම් ව සමාජය ධනපති හා කම්කරු යනුවෙන් පංති දෙකකට බෙදීමට පෙළඹුණේත් බටහිර සමාජය එලෙස පන්තිවලට බෙදීමට සංස්කෘතිකව ම හුරු වී සිටි බැවින් යැයි සිතිය හැකි ය. එහෙත් මුළු සමාජය ම එලෙස පංති දෙකකට පමණක් බෙදිය නොහැකි බවත් ඉතා විශාල පිරිසක් ඒ පංති දෙකෙන් එකකට වත් අයත් නො වන බවත් මාක්ස් පඬිවරයා ද දැන සිටියේ ය.

හුදී ජනයා ගේ පහන් සංවේගය සඳහා ලියැවුණු මහාවංශය රචනා කෙරුණේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇති වීමට වසර දහසකට පමණ පෙර ය. එකල ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විෂය වෙන් කිරීමක් නො වී ය. අද ද සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විෂය වෙන් කිරීමක් නැත'

කෙසේ නමුත් අදාළ ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් ස්ඵුට වූයේ පද බෙදීම පිළිබඳ ඒකමිතියක් ඒ ශිෂ්‍යයන් විසින් අනුගමනය කර නැති බවයි.

**නිදසුන්**

1

එකල ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විෂය වෙන් කිරීමක් නොවීය.

එකල ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විෂය වෙන් කිරීමක් නොවී ය.

එකල ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විෂය වෙන් කිරීමක් නො වීය.

එකල ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විෂය වෙන්කිරීමක් නොවීය.

2

හුදී ජනයා ගේ පහන් සංවේගය සඳහා ලියැවුණු මහාවංශය රචනා කෙරුණේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇති වීමට වසර දහසකට පමණ පෙර ය.

හුදී ජනයාගේ පහන් සංවේගය සඳහා ලියැවුණු මහාවංශය රචනා කෙරුණේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇති වීමට වසර දහසකට පමණ පෙරය.

හුදීජනයා ගේ පහන් සංවේගය සඳහා ලියැවුණු මහාවංශය රචනා කෙරුණේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇති වීම ට වසර දහසක ට පමණ පෙර ය.

තවද එමගින් නිරීක්ෂණය වූ කරුණක් වන්නේ එම ශිෂ්‍යයන්ගෙන් ඇතැමෙකු සිදුකළ පද බෙදීමට තර්කයක්ද නොමැති බවයි.

එබැවින් මෙම නියමු අධ්‍යයනය තහවුරු කරන්නේ පද බෙදීම සම්බන්ධ සංදිග්ධතාවයි. කෙසේ වෙතත් භාෂාවක් යනු වාහනයක් මාර්ගයේ ගමන් ගන්නා අයුරෙන් නීති දමා පාලනය කළ හැකි එකක් නොවෙයි. එබැවින් ඊට අදාළ රීති හා නිර්දේශ ලේඛකයාට ස්වායත්ත වෙයි. ඉහත නිදසුන් එය තහවුරු කරයි.

## 07 සාහිත්‍යය නිර්මාණවල පද බෙදීම

සිංහල භාෂාවේ පද බෙදීම අරබයා ඒකමිතියක් නැති රූප රාශියක් පවතී. එසේම විවිධ ලේඛකයන්ගේ සාහිත්‍යය නිර්මාණ කෘති අධ්‍යයනය මගින්ද මෙම විසම්මුතික ස්වභාවය අවබෝධ කරගත හැකිය. එම සියලු සම්මුති මේ වන විට ආධුනික ප්‍රවීණ භේදයකින් තොරව භාවිතයේ තිබීම මගින් පද බෙදීමේ ගැටලුව, ගැටලුවක්ද යන්න පවා ගැටලුවකි. වහරනු සෙරෙන් සපයා යන පුරාණ නිර්දේශයද එහිලා සිහිකැඳවෙයි.

**සිංහල ලේඛන රීතිය** නැමැති කෘතියේ දී අවධාරණය කරන්නේ නො නිපාතය වෙන් කොට ලිවිය යුතු බවයි. නො නිපාතය වෙන් කළ යුතු ස්ථාන ලෙස එහි දක්වා ඇත්තේ ක්‍රියා පදයක පෙරටුව නො යෙදුණොත් පමණි. නාම පදයකට පසුව නො නිපාතය වෙන්

කරන්නේද නොකරන්නේද යන්න පිළිබඳව පැහැදිලි සටහනක් දක්වා නැත. එසේම නිපාතය වෙන් කළ යුතු මූලික පසුබිම්ද එහි දක්වා නැත. නො නිපාතය දෙවැනි වචනයෙන් වෙන් කොට ලිවිය යුතු බව පමණක් දක්වා තිබේ. ඒ දෙවැනි වචනය ක්‍රියා පදයක්ද එසේ නොවේ නම් නාම පදයක්ද යන්න පිළිබඳව පැහැදිලි සටහනක් දක්වා නැතත් නිදසුන් මගින් ක්‍රියා පද පමණක් දක්වා ඇත (සි.ලේ.රී, 2015:89). එහෙත් **සිංහලයේ පද බෙදුම** නැමැති කෘතිය රචනා කළ අරිසෙන් අහුබුදු සහ ලියනගේ ජිනදාස දෙදෙනා විසින් නො නිපාතය යෙදිය යුතු ආකාරය පිළිබඳව කරුණු ඉදිරිපත් කොට ඇත්තේ සිංහල ලේඛන රීතියට වඩා තරමක් වෙනස් ආකාරයටය. එනම් නො නිපාතය සඳහා වෙනම පරිච්ඡේදයක් මෙහි වෙන්කොට ඇත. ක්‍රියා පදයකට මුලින් යෙදුණු නො නිපාතය වෙන් කොට ලිවිය යුතු බව උදාහරණ සහිතව මෙහි දක්වා තිබේ. එසේම එහිදී ක්‍රියා පදයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලිව සටහන් කොට තිබේ. එනම් ආඛ්‍යාත පදයක් පූර්ව ක්‍රියා, අනාගත ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා යන ක්‍රියා පදවලට පෙරටුව නොයෙදෙන්නේ නම් එය වෙන් කොට ලිවිය යුතු බවය. එසේම නාම පදයකට පෙරටුව නෝ නිපාතයේ යෙදුණද එය වෙන් නොකළ යුතු බව ඔවුන්ගේ අදහසයි. මෙය නිදර්ශන සහිතව ඔවුහු පෙන්වා දෙති **(අරිසෙන් හා ලියනගේ, 1959: 19).** ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමය මගින් පළ කරන ලද **සිංහලයේ වචන වෙන් කිරීමේදී** නො නිපාතය එකතු කොට ලිවිය යුතු බව අවධාරණය කොට තිබේ. එහිදී ක්‍රියා පද මෙන්ම නාම පද සමඟ ද නො නිපාතය එක් කොට ලිවිය යුතු බව ඔවුන්ගේ අදහසයි **(අරිසෙන් හා ලියනගේ, 1959: 19).** ලයනල් ලොකුලියන විසින් සකස් කරන ලද **සිංහලයේ පද බෙදීමේදී** නාමයකට හා කෘදන්තයකට ද විශේෂණයක් වශයෙන් නො යෙදීමේදී එය වෙන් නොකළ යුතු බව ඔහු පෙන්වා දෙයි. ඒ හැරුණු කොට ආඛ්‍යාතයකට හෝ නිපාතයකට හෝ පූර්වයෙන් නො යෙදෙන විට නො වෙන් කළ යුතු බව ඔහුගේ අදහසයි. මෙහිදී ඔහු පෙන්වාදෙන්නේ නිපාතයකට පූර්වයෙන් යෙදෙන අක්ෂර පවා වෙන් කළ යුතු බවයි **(ලොකුලියන, 1972: 7).** සිංහල ලේඛන ව්‍යවහාරය උපදේශ සංග්‍රහය නැමැති කෘතියේ දී නො නැමැති නිපාතය වෙන් කොට ලිවිය යුතු පදයක් ලෙස ඉදිරිපත් කරයි. **(සි.ලේ.උ.ස,2014: 142).** බන්දුසේන ගුණසේකර විසින් නො නිපාතය නිපාත ක්‍රියාවකට මුලින්

සිටින විට වෙන් කොට ලිවිය යුතු බව දක්වා ඇත (**ගුණසේකරඃ 104**). නො නිපාතය යෙදීම පිළිබඳව විද්වතුන් විසින් ඉදිරිපත් කරන අදහස් අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වන්නේ නො නිපාතය යෙදීම පිළිබඳව විද්වතුන් අතර ඒකමතික තීරණයක් නොමැතිව බවයි. තවද ජේ බී දිසානායක පෙන්වාදෙන්නේ නො නිපාතය එක්කොට හෝ වෙන් කොට ලිවිය හැකි නිපාතයක් ලෙසයි (**දිසානායක, 2016 ඃ54**). එම අදහස්ම බොහෝ විද්වතුන් පසු පසුකාලීනව පිළිගත් බව දක්නට ලැබේ.

ම යන්න එක්කළ යුතුද නොවේද යන්න සැලකීමේදී **සිංහලයේ පද බෙදුම** නැමැති කෘතිය රචනා කරන අරිසෙන් අහුබුදු සහ ලියනගේ ජිනදාස ම අක්ෂරය නිපාතයක් බැන් වෙන් කොට ලිවිය යුතු පදයක් ලෙස දක්වා ඇත (**අරිසෙන් හා ලියනගේ, 1959ඃ 13**). එහෙත් **සිංහලයේ වචන වෙන් කිරීම** නම් ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමය විසින් ප්‍රකාශයට පත් කොට ඇති කෘතියේ දී ඔවුන් පෙන්වා දෙන්නේ ම නිපාතය පෙර පදය හා එක් කොට ලිවිය යුතු බවයි (**සි.ව.වෙ.කි,1992ඃ10**). ම යෙදීම සම්බන්ධව වෙනම රීතියක් නොදක්වතත් ලයනල් ලොකුලියන විසින් සම්පාදනයය කරන ලද සිංහලයේ පද බෙදීමේ දී ඔහු ම වෙන්ම පදයක් ලෙස සලකා ඇත (**ලොකුලියන,1972ඃ1**).

**සිංහලයේ පද බෙදීම** නම් ග්‍රන්ථයේ දී ලයනල් ලොකුලියන ව යෙදීම් පිළිබඳවද ද යෙදීම පිළිබඳව කරුණු දක්වා ඇත. එබැවින් ඒ ධාතුවෙන් ලැබෙන රූප ඊට ඉදිරියෙන් ඇති නාමය හෝ නිපාතය ම සමග එක් නොකොට වෙන් වශයෙන් ලිවිය යුතු බවට ඔහු කරුණු දක්වයි. ව ධාතුවක් ලෙස සලකන විටදී එය වෙන් කළ යුතු බව ඔහුගේ මතයයි.

**සිංහලයේ වචන වෙන් කිරීම** නැමැති කෘතිය සම්පාදනයය කරන ලද ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමය ප්‍රකාශ කරන්නේ ව වීමේ ධාතුවෙන් නිපන් ද සංවෘත ව කියැවෙන ව කාරය පෙර පදය සමඟ එකතු කොට ලිවිය යුතු බවයි. අනෙක් සෑම ස්ථානයකම එය වෙන් කොට ලිවිය යුතු බව ඔවුහු පෙන්වා දෙති (**සි.ව.වෙ.කි,1992ඃ11**). මෙහිදී ඇතිවන ගැටලුව නම් **සිංහලයේ වචන වෙන් කිරීම** කෘතිය සම්පාදනය කළ ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමය අනුව ව පදය එකට එකතු කොට ලියන අතර ලයනල් ලොකුලියන විසින් සකස්

කරන ලද සිංහල පද බෙදීමේදී ව යන්න වෙන් කොට ලියා ඇත. ආධුනිකයෙකු මෙබඳු ස්ථානයක සංදිග්ධතාවට පත්වවීම වැළැක්විය නො නොහැකිය. **සිංහලයේ පද බෙදුම** නම් ග්‍රන්ථයේ දී අරිසෙන් අහුබුදු සහ ජිනදාස දෙදෙනා විසින් මුසු තැන් නැමති පරිච්ඡේදයේ දී මේ ධාතුවෙන් ලැබෙන්නා වූ වූ රූප වාක්‍යයක එම වාක්‍යයට මුලින් ඇති පදය හා එකට එකතු කොට ලිවිය යුතු බව දක්වයි. ඒ අනුව නාමයකට පසුවත් නිපාතයට පසුවත් ව ඈත් කොට ලිවිය යුතු බව ඔවුන්ගේ අදහසයි. **සිංහල ලේඛන ව්‍යවහාරය උපදේශ සංග්‍රහය** ව වීමේ ධාතුවෙන් නිපන් රූපය පෙර පදය සමඟ එක් කොට ලිවිය යුතු බව අවධාරණය කරයි. මේ සඳහා විකල්ප රීතියක් ද එහි හඳුන්වා දී ඇත **(සි.ලේ.උ.ස,2014:137).** ව වීමේ ධාතුවෙන් ලැබෙන්නාවූ ඇතැම් පද වෙන් කොට ලිවිය හැකි බව අවධාරණය කොට ඇත. එහිදී වන වෙන වී වුණු වූ ආදිය මෙලෙස වෙන් කොට ලිවිය හැකි බව ඔවුහු අවධාරණය කරති **(සි.ලේ.උ.ස,2014:145).** ජේ බී දිසානායක පෙන්වාදෙන්නේ ව නිපාතය වෙන්කොට හෝ එකතු කොට ලිවිය හැකි බවයි **(දිසානායක, 2016: 7).**

ඉහත නිදර්ශන මගින් පෙනී යන්නේ පද බෙදීම විෂයයක ඇති විසම්මුතිකත්වයයි. මෙමගින් ව්‍යාකුලත්වයක් ඇති වන බව සැබැවි. එහෙත් භාෂාවක් යනු සෑම විටම නීති මගින් පාලනය කළ නොහැකි සංසිද්ධියකි. කෙසේ නමුත් සාකච්ඡාව මගින් මතු කර ඇති පරිදි පද බෙදීමෙහිලා ඇතිවන සංදිග්ධතාවලට විසඳුමක් සඳහා දීර්ඝ අධ්‍යයනයක් විධිමත්ව කළ යුතුය. එහිලා සාම්ප්‍රදායික ව්‍යාකරණය හා වාග්විද්‍යාව යන විෂයද්වයෙහිම ශික්ෂණය ලැබූ පර්යේෂකයන් අන්‍යෝන්‍ය සහභාගිත්වයෙන් යුතුව සිදු කරනු ලබන පර්යේෂණයක් වඩා උචිත වෙයි.

**08 යෝජනා**

මෙම පර්යේෂණයෙන් ලද මූලික නිරීක්ෂණය වූයේ පද බෙදීමෙහිලා සංදිග්ධතාවක් ඇත යන්න බැවින් එය කළමනාකරණය පිණිස පහත යෝජනා ඉදිරිපත් කරමු.

1. අප කථනයේදී පද බෙදන්නේ කෙසේද යන්න පිළිබඳ ස්වභාවික වාක්‍ය ඛණ්ඩ පටිගත කොට ඒවා ශබ්දාගාරයක නිසි විද්‍යාත්මක අධ්‍යයනයකට නතු කළ යුතුය.

2. පද/වචන එක්ව හෝ වෙන්ව තැබීමෙන් පාඨක මනසේ සංජානනයට හානි නොවේ නම් ලේඛකයාට තමන් කැමැති රීතියක් අනුගමනය කිරීමේ නිදහස තිබිය යුතුය. එහෙත් අදාළ ලේඛනයේ ඓන්ද්‍රියත්වය පිණිස එකම ක්‍රමවේදය අනුගමනය කොට සංදිග්ධතාවක් ඇතිවීම වැළැක්විය යුතුය.
3. දැනට නිර්දේශිත සියලුම පද බෙදීමේ නීති රීති එක් කෘතියකට ගත යුතුය.
4. පද බෙදීමේ විකල්ප රීති ලෙස ඒ ඇසුරෙන් නව රීතියක් නිර්මාණය කළ යුතුය

**සටහන** : මෙම පත්‍රිකාවේ පද බෙදීමෙහිලා අනුගමනය කර ඇත්තේ සිංහල වචන වෙන් කිරීමේ රීතියයි.

## ආශ්‍රිත මූලාශ්‍රය

අහුබුදු අරිසෙන් හා ජිනදස් ලියනගේ **සිංහලයෙහි පද බෙදුම**. (1959) කොළඹ: ඇම් ඩී ගුණසේන සහ සමාගම.

ගුණසේකර, බන්දුසේන

තෙන්නකෝන් රැයිපියෙල් **පහදුව**. (1993) කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

ද සිල්වා,නලින්. **අපේ ප්‍රවාද**. උපාලි ප්‍රකාශකයෝ: විදුසර 2008 මැයි 07.

දිසානායක, ජේ .බී **නිවැරදි සිංහලය**. (2018) සුමිත ප්‍රකාශකයෝ.

දිසානායක, ජේ .බී **සිංහල රීතිය -පද බෙදීම**. ( 2016) සුමිත ප්‍රකාශකයෝ.

මාරසිංහ, වෝල්ටර් **සුබැසිවහර**. (2011) කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ .

මොහොට්ටි දෝ දේ සහ තිලකසිරි සමන් **නිවැරදි සිංහල මග**.(1989) කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ .

රාජපක්ෂ, ධර්මා **සිංහල භාෂාවේ පද බෙදීම සහ විරාම ලක්ෂණ භාවිතය.** (2008) කර්තෘ ප්‍රකාශන.

ලොකුලියන, ලයනල් **සිංහලයේ පද බෙදීම**. (1972) කොළඹ: ඇම් ඩී ගුණසේන සහ සමාගම.

සෙනරත් යාපා, මුනිදාස **නිවැරදි වහරට අත්වැල-පදබෙදීම**.(1989) කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ .

සේනාධීර, ගුණපාල **නිවැරදි වහර-පද බෙදීම**. (1984) කොළඹ: ඈස් ගොඩගේ සහ සහෝදරයෝ.

**සිංහලයේ වචන වෙන් කිරීම**.(1992) කොළඹ: ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමය.

**සිංහල ලේඛන රීතිය**. (2015 )මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

**සිංහල ලේඛන ව්‍යවහාරය:උපදේශ සංග්‍රහය**. (2014) මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

**සිදත් සඟරා විස්තර සන්නය**. (1902) ධර්මාරාම හිමි, රත්මලානේ විද්‍යාලංකාර යන්ත්‍රාලය.